හිම බිඳුම් සුදු රෝස

10

පර්ත් හි
විද්‍යානි මනතුංග ලියන
නව කතාව

අප ගෙදර යන විට සියල්ල සූදානම් කරගෙන අම්මා බලා සිටියාය.

"පුතාගෙ පණිවිඩය ලැබුණහම මම මහේලට කෝල් කළා...."

"අම්ම කොහොම ද මහේලගෙ ෆෝන් නම්බර් එක දන්නෙ?"

"ඊයෙ මට ටාන්‍යා දුන්නනෙ... මම හිතුව මහේලයි ටාන්‍යයි එකට එනව ඇති කියල... මහේලයි කිව්වෙ එයා පරක්කු වෙන නිසා ටාන්‍යා පුතත් එක්ක එන බව..."

ටාන්‍යා එන්නේ මහේල එක්ක යැයි අම්මා සැක කළේ ඇයි?

"කන්ග්‍රැජුලේෂන් ටාන්‍යා... ඔයා ඊයෙ කියනකම්ම මම දැනගෙන හිටියෙ නැහැනෙ ඔය දෙන්න එන්ගේජ් වෙලා බව... කොච්චර හොඳ ද? වෙඩින් එකට දිනයක් තීරණය වුණහම කියන්න....අපිට කරන්න පුළුවන් හැම උදව්වක්ම අපි කරන්නම්... නේද පුතා?"

මම හිස වනා ඇගේ අදහස් අනුමත කළෙමි. ඒ වෙනුවෙන් පැවසිය යුතු පිළිතුරක් මා වෙත නොමැත. ඒ අතර කිසිවක් ම නොකියා ටාන්‍යා අම්මාව වැළඳගෙන සිප ගන්නවා මම දුටිමි. මා ටාන්‍යාව ගෙදර කැඳවාගෙන ඒමෙන් ඈට කළේ හොඳක් යැයි සිත කියයි. දැන් අම්මා සියල්ල දන්නා බැවින් මහේල නාවත් මම ඒ ගැන අසතුටු නොවෙමි. එහෙත් ඔහු පොරොන්දු වූ පරිදි පැමිණියේය.

එදින රාත්‍රිය සතුටින් ගෙවී ගියා යැයි මට සිතුණි. තාත්තා ද, ටාන්‍යා ද කෑම මේසයේ දී ඡායාරූප කිහිපයක් ම ගත්තාය. කෑමෙන් පසුව ලැබුණ මද අස්වැසිල්ලක දී මම මහේලට පසෙකට කතා කළෙමි.

"මහේල උඹ මේ කෙල්ලව ආශ්‍රය කරන්නෙ ඇත්තටම ද?"

"ඇයි නැත්තෙ? උඹ මොකද එහෙම ඇහුවෙ?"

"ඇත්තටම නම් ප්‍රශ්නයක් නැහැ... එහෙම නෙමෙයි නම් ඒක දැන්මම ඒ කෙල්ලට පැහැදිලි කරන එක හොඳයි..."

"උඹට අමු කැවිල ද? අනික ඒක ටාන්‍යගෙයි මගෙයි කතාවක්... උඹ ඒක අමාරුවක් කරගන්න ඕනෑ නැහැ...."

මහේලට තරහා ගොස් ඇත. ඒත් මේ මට තරහ ගැනීමට අවස්ථාව නොවේ. ටාන්‍යා වෙනුවෙන් මම ඉවසා කතා කළෙමි.

"මහේල උඹ ගෙදරට කියල ද තියෙන්නෙ ටාන්‍යා ගැන...?"

"ටිකක්... ඇයි ටාන්‍යා මුකුත් කිව්ව ද ඒ ගැන උඹට...." මා දන්නා කිසිවක් ඔහුට කිවයුතු නොවේ යැයි සිත කියයි.

"නෑ එයා මුකුත් කිව්වෙ නම් නැහැ. ඒත් උඹ එයාව එක්කගෙන ආවෙ ගෙදරට අඳුන්වල දෙන්න කියලයි මම හිතුවෙ...."

"මම එක්කන් ආව එකෙක් නැහැ බං... එයාගෙ උවමනාවටයි එයා ආවෙ..." මා සිතුවා හරිය. මහේල තුළ ඈ කෙරෙහි ඇත්තේ ආදරයක් නොව නිකම්ම නිකම් හැඟීමක් පමණි.

"දැන් මොනව ද උඹල දෙන්න කරන්න ඉන්නෙ පර්ත් ගිහිල්ල..."

"විශේෂ ප්ලෑනක් නම් නැහැ. බලමුකො එන හැටියකට...."

දැනටමත් මට කිවූ ප්‍රමාණය වැඩි යැයි ඔහු සිතාගන්නට ඇත. මහේල හිත යට එකක් තියාගෙන උඩින් තවත් එකක් තියන ආකාරයේ පුද්ගලයෙක් බව මම අත්දැකීමෙන් දනිමි. එහෙත් ඒ සියල්ල ඔහු කළේ ටාන්‍යා සම්බන්ධයෙනි. ඒ හැර අනිත් සෑම අවස්ථාවකම ඔහු මට හොඳ මිතුරෙක් විය. මම මගේ මිතුරන්ගේ හොඳකම මට වාසි වන අයුරින් ඔවුන් හැසිරෙන නිසා මනින්නෙක් නොවන්නෙමි. මා කෙරෙහි මෙන් ම ඔවුන්ට විශේෂ වාසියක් ලබාගත නොහැකි පුද්ගලයන් කෙරෙහි ද ඔවුන් එලෙසට අවංක වන්නේ නම් මම එවැනි මිතුරන් ගරු කරන්නෙමි. මහේල තුළ මම එවැනි ගරු කටයුතු තත්වයක් නොදකිමි. නමුත් ඔහු ටාන්‍යාගේ සිත දිනාගෙන ඇති නිසා ම මම ඔහු කෙරෙහි අහිතක් නොසිතමි.

> ඒ රැය මගේ සිත අතිශයින්ම චංචල වූ රැයක් විය. නින්ද යාගෙන එන සෑම මොහොතකම මම ටාන්‍යාව හීනෙන් දුටුවෙමි. ඈ දවල් ඇඳ සිටි සුදුපාට ගවුමින් සැරසී මා ඇයට නෙලා දුන් සුදුපාට මල් මිටිය අතටගෙන සිටියාය.

"මහේල උඹ මට එක පොරොන්දුවක් වෙන්න ඕනෑ..."

"පොරොන්දුවක්..."

"ඔව් පොරොන්දුවක්... උඹ මට පොරොන්දු වෙන්න ඕනෑ කවදාවත් හිතා මතා ටාන්‍යාගෙ හිතට දුකක් දෙන්නෙ නැති බවට..." ඒ වචන මගෙන් පිටවෙද්දී මගේ කටහඬ බිඳී තිබිණි. මහේලට ද ඒ බව වැටහෙන්නට ඇත.

"මම පොරොන්දු වෙනව ලහිරු.... ඇත්තට ම මාව විශ්වාස කරපං... මම පොරොන්දු වෙනව උඹට..." මහේල දිගුකල සුරත මම පිළිගත්තෙමි. ඔහු මගේ සුරත දෑතින් ම අල්ලා සොලවන්නට විය.

"ලහිරු... මට සමාවෙයං... මම උඹ ගැන හිතන් හිටියෙ වැරැදි විදිහට..." මම කිසිවක් නොකියා ඔහුට කතාකරන්නට ඉඩ හැරියෙමි.

"මම හිතුව උඹ මාත් එක්ක තරහ ඇති කියල ටාන්‍යා මට කැමැති වුණාට..."

"මම ඒ ජාතියෙ මිනිහෙක් නෙමෙයි මහේල..."

"මට තේරෙනව මචං. ඒකයි මම සමාවෙන්න කිව්වෙ... ඒ දවස්වල උඹ පර්ත් ආවහම... මම හිතුව උඹ ඇවිත් ඉන්නෙ ටාන්‍යා නිසයි කියල. ඒක මට අවාසියක් වෙයි කියල හිතලයි මම උඹව මඟ ඇරියෙ..."

"දැන් ඕව අමතක කරපං මහේල. ටාන්‍යා උඹට කැමැතියි. උඹ ටාන්‍යාට කැමැතියි. හැබැයි, ඒ කැමැත්තවල් ඉදිරියට ගෙනියන එක තියෙන්නෙ සම්පූර්ණයෙන් ම උඹේ අතෙයි. අන්න ඒක විතරක් හොඳට මතක තියාගනින්." මම ඒ කතාව එතනින් හමාර කෙරුවෙමි.

සියල්ලන්ම එක්ව විවිධාකාරයේ මාතෘකා කතාබහට එක්කර ගනිමින් බරාදයේ තවත් පැය කිහිපයක් ගතකර දැමුවේය. තාත්තා බොහෝ විට කතාකරන ලද්දේ ටාන්‍යාට පෙන්විය හැකි ස්ථාන මොනවා ද යන්න ගැනයි. මම ඒ මාතෘකා කිසිවකට මැදිහත් නොවීමි. කල් ඇතිවම නිදාගැනීමට සූදානම්ව ඔවුන්ගෙන් සමුගන්නා අතර හෙට උදෑසනම රැකියාව වෙනුවෙන් මම පිටත්වන බව ද හැම කෙනෙකුටම පොදුවේ කීවෙමි.

"පුතා ඔයාටයි, මහේලටයි මම අද පහල කාමර දෙකක් ලැහැස්ති කරල තියෙන්නෙ. ටාන්‍යාට උඩ කාමරයක් ලැහැස්ති කළා. එහෙම හොඳයි නේද?"

"හොඳයි අම්ම. මගේ කාමරේ විතරක් පෙන්නුවහම ඇති දැනට..." අම්මා සිනාසෙමින් මා සමඟ පැමිණියේය. මා පැමිණි පසු වැඩි වේලාවක් නොයාම පිරිස විසිරී යනවා මට ඇසිනි.

ඒ රැය මගේ සිත අතිශයින්ම චංචල වූ රැයක් විය. නින්ද යාගෙන එන සෑම මොහොතකම මම ටාන්‍යාව හීනෙන් දුටුවෙමි. ඈ දවල් ඇඳ සිටි සුදුපාට ගවුමින් සැරසී මා ඇයට නෙලා දුන් සුදුපාට මල් මිටිය අතටගෙන සිටියාය. ඒ මල් කිහිප ගුණයකින් විශාල වී ඇය අත රැඳී තිබිණි. ඇය සිනාසෙමින් මා වෙත ලංවෙමින් සිටියාය. එහෙත් හදිසියේ ම අප අතර දුර එන්න එන්නම වැඩි විය. මම තිගැස්සී නින්දෙන් අවදි වුණෙමි.

ඇඳෙන් නැඟී සිට ජනේලය වෙතට ගිය මම

එය විවර කර දැමූවෙමි. ඈත ලස්සනට හඳ පායා තිබේ. පොළොව මතුපිට එක් තලයක් පමණක් හඳ එළිය වැටී දිලිසෙමින් තිබූ අතර ඊට යටින් වූ සියල්ල තද නිල් සහ කළු පැහැ වූ අඳුරක ගිලී පැවතිනි. මගේ හදවතත් අද පවතින්නේ මෙවැනිම වූ තත්වයක නොවේදැයි මට සිතේ.....

ටාන්‍යාගේ අතීත මතකයත්, ඈ වෙතට මා තුළවන ආදරයෙනුත් ගිලී ගිය ඒ මතුපිට හදවත කොයිතරම් නම් සුන්දර ද?.... නමුත් ඉන් ගැඹුරට මගේ අනාගතය වෙත සිතුවිලි යෙමු කරන සෑම මොහොතකම මා සිත ගිලී යන්නේ තෙරක් නොපෙනෙන අඳුරකය.....

පොත්පත්වල අප කියවූ, අප අසා තිබූ ඒ විවිධ ආදර චරිත පිළිබඳව මිතුරන් හා සිනහසුණු යුගය මට මතකය. ඒ කිසිවක් හැබෑ ලෝකය තුළ නොදකින මනස්ගාත චරිත යැයි කියමින් අපි ගතකළ යුගයක් විය. එහෙත් අද මට සිදු වී ඇත්තේ කුමක් ද....? 'ගොලු හදවතේ' සුදත් පවා එක අතකින් මට වඩා වාසනාවන්තයකි. ඔහුට සැනසුමක් තිබේ යැයි ඔහු සිතූ බීමත්කමට නැඹුරුවන්නට නිදහසත්, අයිතියත් සැබෑ ලෝකයේ ඔහු සතුව තිබිණි. මා සතුව එවැනි අයිතිවාසිකමක් හෝ නිදහසක් නැත්තේය. මට සිදුව ඇත්තේ වේදනාකාරී ලෙස මගේ ආදරය රහසක් කර ගන්නටත්, මගේ සිතිවිලි උපන් තැනම ගල් කර දමා සම්මත ලෝකයේ ආචාර ධර්මවලට යටත් වන්නටත්ය....

එදා ඒ රාත්‍රිය තරම් ටාන්‍යා වෙනුවෙන් මා තුළ වන ආදරය මුල්කොටගෙන මා දුක්විඳි වෙනත් දිනයක් මට මතක නැත. හදවතේ මතුව ආ වේදනාවට මා දෙනෙත් තෙත්වී ගොස් තිබිණි. ඒ රාත්‍රිය තුළ හැකිතාක් මගේ හදවතේ දෙරගුළු මා විවර කර දමනු ලැබුවේ, නැවත එවැනි සමාවක් හදවතට කිසිදිනෙක නොලැබෙන්නේය යන විශ්වාසය මතය. පාන්දර හතරත් ඔරලෝසුවේ කියවනවා මට මතකය. ඉන්පසු මට නින්ද ගොස් තිබිණ.

"පුතා, නැගිටින්න ඔයා උදේම යන්න ඕනෑ කිව්ව නේද වැඩට?" මා තිගැස්සී අවදි වූයේ අම්මාගේ කටහඬිනි. ඒ වන විට වෙලාව පහයි තිහ වී තිබිනි.

"අනේ ඇයි අම්ම මට පහටවත් කතා කළේ නැත්තෙ?"

"මට දුක හිතුණ පුතා නිදාගෙන ඉනන හැටි දැක්කහම.... ඊටත් වඩා මේ ජනේලෙත් ඇරලා... කාමරරේ හරිම සීතලයි මම එනකොට.... ඔයාගෙ ඇඟත් රත්වෙලා වගේ නේද? ඔයාට සනීප නැද්ද?"

"පිස්සුද අම්මට. මට ඇති අසනීපයක් නැහැ..."

මම ඉක්මනින්ම මුහුණ සෝදා ගෙන හැඳගතිමි. මගේ ඇඳුම් සියල්ල ඒ වන විට අම්මා ලැහැස්ති කර තිබුණාය. ජැකට් එක.... මට එය සිහිවූයේ එවිටය. එය තවම ටාන්‍යා ළඟය. මේ එය නැවත ලබා ගැනීමට වෙලාව නොවේ.

අම්මා බලකරත්දීම තේ එකක් පමණක් බිවූ මම කෑම වෙනුවෙන් නොනැවතී පිටත්වන්න සූදානම් වූයෙමි. තාත්තා ද ඒ වන විට අවදි වී සිටියාය. ඔහු කවදත් හය වන විට අවදි වන්නෙකි. මට රැගෙන යාමට කෑම මල්ලක්ම අම්මා ඒ වන විට ද සූදානම් කර හමාරය. මම ඔවුන් දෙදෙනාගෙන් සමුගතිමි. ටාන්‍යා ද මහේල ද තවමත් නින්දේ විය යුතුය. මම ඒ දෙදෙනා ගැන වදනකුඳු නොකියා පිටත්වන්න සිහි තබාගතිමි. ඒ අය කැමැති ආකාරයකට ඔවුන්ගේ දිනය පිළියෙළ කරගන්තාවේ යැයි සිතාගතිමි. වැඩි හඬක් නොනගාම කාරය පණගැන්වූ මම පෝටිකෝව යටින් පිටත් වී මහපාරට යෑම සඳහා 'එස්.' අකුරේ හැඩයට ඇති බෑවුම් වූ මාර්ගය දිගේ එය සෙමින් පහලට ගෙනගියෙමි. මහපාරට අවතීර්ණ වීමට පෙර කාරයේ වේගය අඩු කොට ගෙදර උඩුමහල දෙස නෙත් යොමුකළේ හදිසියේ සිතට නැගි අදහසකට අනුවය. මා පුදුමයට පත්කරලමින් ටාන්‍යා සඳළුතලයේ සිට මා දෙස බලාගන්වනම සිටියාය. මා ඈ දෙස බලනවා දුටු ටාන්‍යා මට අත වැනුවාය. ඒ උදෑසන මීදුම මැදින් මා ටාන්‍යා දුටුවේ හිම කුමාරියක මෙනි. ඈ ඇඳ සිටියේ ලා පැහැති අම්මාගේ දිග ගවුමකි. උරහිස දෙසප විහිදාගෙන සිටි ඇගේ සුදු කෙස් කළඹ ප්‍රථම වතාවට ඇගේ මුහුණට සුන්දරත්වයක් ගෙන දෙන්නේ යැයි මට ඒ මොහොතේ සිතිනි. මගේ හැදියාව මා වෙත සිහි එළවා දුන් අයුරින් මම කාරයේ තිරිංග තදකර දොර ඇරගෙන පිටතට බැස්සෙමි. ඇයට ද ප්‍රති සිනහවකින් පිළිතුරු දී අත වනා නැවත කාරයට නැග මොහොතකට හෝ යළිත් ඈ

මෙතෙක් කතාව

උසස් අධ්‍යාපනය හමාර කිරීමෙන් පසු පර්ත් වලින් පිටත්ව යන ලහිරු නැවත වරක් පර්ත් පැමිනෙන්නේ හදවතට දැනීයන නුපුරුදු එහෙත් සුන්දර වූ ආදරයක ස්පර්ශයක් නිසාය. නමුත්, ඉරණම් සහගත ලෙසට තම දෙනෙත් අබියසදීම අහිමි බවට පත්වන ආදරයක මතක සටහන් සමග හුදකලා වීම වෙනුවෙන් මව් බිම කරා යන ලහිරුට, තවත් දෙදෙවෝපගත සිදුවීමක් ලෙසට නැවත වරක් ටාන්‍යා ලංකාවේදී මුණගැසේ.